# 7
# කථක් නර්තන සම්ප්‍රදායෙහි භාවිත සුවිශේෂී ශිල්පීය ලක්‍ෂණ

*එම්. ඒ. එස්. ආර්. මුණසිංහ* [1]
HU/2011/0637

කථක් නර්තන සම්ප්‍රදායෙහි භාවිත සුවිශේෂී ශිල්පීය ලක්‍ෂණ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වේ. කථක් උත්තර භාරතයේ ප්‍රචලිත සම්භාව්‍ය නර්තන සම්ප්‍රදායක් වන අතර එය ශෘංගාර රසය ප්‍රමුඛ කොටගත් ලෞකිකත්වය කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වන නර්තන සම්ප්‍රදායක් වේ. මේ සඳහා බෙහෙවින් ඉවහල් වී ඇත්තේ මෙම සම්ප්‍රදාය තුළ භාවිත කරනු ලබන ශිල්පීය ලක්‍ෂණ වීම වැදගත් ලක්ෂණයකි. එනම්, ගෙජ්ජි භාවිතය, චක්‍ර භාවිතය, බෝල් පද භාවිතය වේ. මෙම මාතෘකාව පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ලිඛිත මූලාශ්‍ර මෙන්ම අන්තර්ජාලය භාවිතය තුළින් දත්ත ඒකරාශී කර ගැනීම, ක්ෂේත්‍රයෙහි ප්‍රවීණයන් සමඟ සාකච්ඡා කොට දත්ත ලබා ගැනීම, නර්තනාංග නැරඹීම ආදී ක්‍රමෝපායන් උපයෝගී කරගන්නා ලදී. කථක් නර්තනයෙහි මෙම ප්‍රවණතාව උදෙසා මෝගල් බලපෑම හේතු වී ඇති බව මෙන්ම ගුරුකුල අනුව කථක් නර්තන සම්ප්‍රදායෙහි දක්නට ලැබෙන ශිල්පීය ලක්ෂණවල විෂමතා ද හේතු වී ඇති බව පෙනෙන්නට ඇත. මෙහිදී කථක් නර්තනයේ සුවිශේෂී ශිල්පීය ලක්ෂණවල විෂමතා දක්නට ලැබීම, කාලීනව කථක් නර්තන සම්ප්‍රදායෙහි සිදුවන වෙනස්කම්, ක්ෂේත්‍රයෙහි ප්‍රවීණයන් සොයාගැනීමේ දුෂ්කරතා ආදිය මෙම පර්යේෂණය සිදු කිරීමේදී මුහුණ දීමට සිදු වූ ගැටළු සහගත තත්වයන් ලෙස සඳහන් කළ හැකි ය.මේ අනුව කථක් නර්තන සම්ප්‍රදායෙහි සුවිශේෂී ලක්ෂණ කෙරෙහි ශිල්පීය ලක්ෂණ ඉවහල් වී ඇති බව තහවුරු විය.

ප්‍රමුඛ පදඃ කථක්, නර්තන, සම්ප්‍රදාය, ශිල්පීය, ලක්‍ෂණ

---

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) තෙවන වසර*